# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1802/1 - 2013 මාර්තු මස 18 වැනි සඳුදා - 2013.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(1) වැනි වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) ඌ වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තියෙන් අගලවත්ත ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබ, මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව, 2009 ඔක්තෝබර් මස 16 දින පැවති අගලවත්ත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ අංක 7:9 දරන සභා තීරණයෙන් සම්මතය ලබා ඇත. 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී, ප්‍රාදේශීය සභා පනතේ 123 (i) වැනි වගන්තිය ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාව බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදාන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ වෙළඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය
හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්.
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල,
හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා
ආර්ථික ප්‍රවර්ධන සහ වෙළඳ අමාත්‍ය.

2013 පෙබරවාරි මස 26 වැනි දින,
ශ්‍රාවස්ති මන්දිරය,
කොළඹ 07,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

අගලවත්ත ප්‍රාදේශීය සභාව

**ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත**

1. මේ අතුරු ව්‍යවස්ථා අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ අතුරු ව්‍යවස්ථා සභා බල ප්‍රදේශය තුළ ත්‍රී රෝද රථ නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු අය කිරීම සඳහා පනවනු ලැබේ.


සැ. යු. - අති විශෙෂ ගැසට් අංක 1801/01 කාණ්ඩය අංක 1801/43 න් අවසන් වේ.
1A - PG 001585— 350 (2013/03)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. (1) සභා බල ප්‍රදේශය තුළ ත්‍රී රෝද රථ නවතා තැබිය යුතු ස්ථාන සහ එකී එක් එක් ස්ථානයේ නවතා තිබිය යුතු උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව සභාවේ යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කළ යුතු අතර, එම තීරන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනක හෝ සිට ක්‍රියාත්මක වන්නේය ;

3. (2) ඉහත 3. (1) ව්‍යවස්ථාව අනුව නිශ්චය කළ ත්‍රී රෝද රථ නවතා තබන ස්ථාන හා සංඛ්‍යාව සංශෝධනය කළ යුතු යැයි සභාවට හැඟී යන්නේ නම් සභා සම්මුතියක් මගින් එසේ කල හැකි අතර, එය ගැසට් පත්‍රයක පළකල දිනක සිට හෝ එහි සඳහන් නිශ්චිත දිනක සිට ක්‍රියාත්මක වන්නේය ;

3. (3) ත්‍රී රෝද රථ නැවතුම්පළ ස්ථාන නිශ්චය කිරීම, එහි පරාසයන් තීරණය කිරීම හා නතර කළ හැකි උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව තීරණය කිරීම සඳහා හෝ එම තීරණ සංශෝධනය, පළමුවන උපලේඛනයේ සඳහන් අයගෙන් සමන්විත කමිටුවක නිර්දේශ සභාව විසින් ලබාගත යුතුය ;

3 (4) 3. (1) ව්‍යවස්ථාව අනුව ත්‍රී රෝද රථ නවතා තැබිය යුතු ස්ථාන හඳුනා ගැනීම පිණිස වන පුවරුවක් සෑම නැවතුම්පලක ඉදිරිපිට සවිකල යුතු වන අතර එම පුවරුවේ අදාල නැවතුම්පලේ සංකේත අංකය ප්‍රදර්ශනය කළ යුතුය ;

3. (2) ව්‍යවස්ථාව අනුව නැවතුම්පලක නවතා තැබිය හැකි උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව අදාල පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතුය ;

3. (5) නැවතුම්පලෙහි ත්‍රී රෝද රථ ක්‍රමානුකූලව නවතා තැබිය යුතු අතර, නවතා තැබිය යුතු ආකාරය සභාවේ බලයලත් නිලධාරියෙකු විසින් පළල අඟල් 04ක් වූ සුදු හෝ කහ පැහැති රේඛාවක් මගින් සළකුණු කර තිබිය යුතුය.

4. ප්‍රාදේශීය සභාව විසින් ත්‍රී රෝද රථ නවතා තැබීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවැනි උපලේඛනයේ සඳහන් ආකාරයේ බලපත්‍රයක් සභාපතිවරයා විසින් නිකුත් කිරීම හා ඒ සඳහා ගාස්තු පනවා අය කිරීම නීත්‍යානුකූල වන්නේය.

5. ත්‍රී රෝද රථ නැවතුම්පලක නවතා තබන ත්‍රී රෝද රථ බලපත්‍ර ලබාදීමේදී නැවතුම්පළට ආසන්නම පදිංචිකරුවන්ට අයත් ත්‍රී රෝද රථවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

6. (1) තුන්වන උපලේඛනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි තම ස්ථිර පදිංචියට ආසන්නතම ත්‍රී රෝද රථ නැවතුපළෙහි නවතා තැබීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් බලපත්‍රයක් ඉල්ලුම් කළ යුතු අතර, ඒ සඳහා අයදුම්පත්‍රය රු. 30ක මුදලක් ගෙවා සභාවෙන් ලබාගත යුතුය. මෙම අයදුම්පත්‍ර ගාස්තුව සභාව විසින් ගනු ලබන තීරණ අනුව කලින් කලට සංශෝධනය කළ හැකිවේ ;

6. (2) ත්‍රී රෝද රථ පදවන්නා අයිතිකරු නම්, ඔහුගේද, පදවන්නා කුලී රියැදුරෙකු නම් ඔහුගේ සහ අයිතිකරුගේද පහත සඳහන් ලේඛනවල ඡායාස්ථ පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පත තුන්වන උපලේඛනයේ සඳහන් පරිදි විය යුතුය ;

1. ත්‍රී රෝද රථ හිමිකරුගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය ;
2. ත්‍රී රෝද රථයේ ලියාපදිංචි සහතිකය ;
3. කුලී රියැදුරාගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියැදුරු බලපත්‍රය.

6. (3) සභාවේ බලපත්‍ර ලත් ත්‍රී රෝද රථ සම්බන්ධ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, බලපත්‍රය අවලංගු කරණු ලැබූ විට ඒ බව සටහන් කර රතු තීන්තෙන් සලකුණු කළ යුතුය ;

6 (4) සභාව විසින් මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව හෝ ත්‍රී රෝද නවතා තැබීම සඳහා බලපත්‍ර ලබා දිය හැක ;

6 (5) වලංගු බලපත්‍රයේ ඡායා පිටපතක් පැහැදිලිව පිටතට පෙනන සේ ත්‍රී රෝද රථයේ ඉදිරිපස වීදුරුවේ ප්‍රදර්ශනය කළ යුතුය ;

6 (6) ත්‍රී රෝද රථයේ දකුණු පසින් මඟීන්ට නැඟීම හෝ බැසීම කළ නොහැකි වන සේ අහුරා තිබිය යුතුය ;

6 (7) බලපත්‍රය ත්‍රී රෝද රථයෙහි ලියාපදිංචි හිමිකරු නමට නිකුත් කළ යුතුය ;

6 (8) බලපත්‍රයේ වලංගු කාලසීමාව අවසන් වීමට සති දෙකකට පෙර බලපත්‍රය අලුත් කරවා ගැනීම, ත්‍රී රෝද රථ අයිතිකරු විසින් කළ යුතුය ;

6 (9) ඉහත 6. (4) අනුජේදයේ මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව හෝ පනවා අය කළ යුතු බලපත්‍ර ගාස්තුව සභාව විසින් තීරණය කළ යුතු අතර, එම තීරණ ගැසට් පත්‍රයේ පල කරණු ලබන දිනයක හෝ එහි සඳහන් කරණු ලබන නිශ්චිත දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි අය කළ යුතුය ;

6 (10) 4. වැනි අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස ත්‍රී රෝද රථ නැවතුම්පළකට ත්‍රී රෝද රථයක් ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතුය ;

6 (11) නිකුත් කළ වලංගු බලපත්‍රයක් ඇත්තේ වුවද පොලිස් නිලධාරියෙකු විසින් හෝ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියෙකු විසින් තාවකාලිකව ත්‍රී රෝද රථ නැවතුම් පළෙන් ත්‍රී රෝද රථ ඉවත් කිරීමට විධාන කළ හැකි අතර, මෙම බලපත්‍රය ඊට බාධාවක් නොවිය යුතුය.

7. නැවතුම්පළක වෙනත් වාහන ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතුය.

8. නැවතුම්පලකට ත්‍රී රෝද රථ ඇතුළු වන ස්ථානයට හෝ ඉන් පිටවන ස්ථානයට බාධාවන අයුරින් ත්‍රී රෝද රථ හෝ වෙනත් වාහන හෝ නවතා තැබීම නොකළ යුතුය.

9. නැවතුම්පලක ත්‍රී රෝද රථය ඉවත් කර ගැනීමේ කාර්යයට අදාල යම් අලුත්වැඩියාවක් මිස, නැවතුම්පළ ඇතුලත වෙනත් කිසිදු ආකාරයක අලුත්වැඩියාවක් කිරීම නොකළ යුතුය.

10. යම් ත්‍රී රෝද රථයක් නතර කර තැබීම සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇත්තේ යම් නැවතුම්පළකටද එම බලපත්‍රය අදාළ වන නැවතුම්පලෙහි හැර වෙනත් කවර හෝ ස්ථානයක කුලී ගමනක් අපේක්ෂාවෙන් ත්‍රී රෝද රථයක් නවතා තැබීම නොකළ යුතුය.

11. බලපත්‍රය හිමි ත්‍රී රෝද නැවතුම්පලක ත්‍රී රෝද රථ නවතා ඇති අවස්ථාවේදී සේවයේ යෙදී සිටින රියැදුරන්, එම ත්‍රී රෝද රථ නැවතුම්පලට පිටස්තර පුද්ගලයින් කැඳවා, නිකරුනේ කාලය ගත කිරීමට ඉඩ නොදිය යුතුය.

12. නැවතුම්පලක කවර හෝ තැනැත්තකු විසින් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හෝ දුරාචාරයේ හැසිරීම හෝ වෙනත් කිසිදු පිඩාකාරී ක්‍රියාවක් හෝ නොකල යුතු අතර එවැනි ක්‍රියා කිරීම සඳහා ඉඩ නොදීමට නැවතුම්පල භාවිතා කිරීමට අවසර ලද පුද්ගලයන්ගේ වගකීමක් වේ.

13. බලපත්‍රයක් හිමි කවර වූ හෝ තැනැත්තෙකු විසින් නැවතුම්පලක විෂමාචාර ක්‍රියාවක නිරත වූ බවට ජනතාවගෙන් පැමිණිල්ලක් ලද අවස්ථාවක ඒ බව පරීක්ෂණයක් පවත්වා සනාථ වුවහොත් ඔහුගේ බලපත්‍රය අහෝසි කිරීමේ බලය සභාව සතුවේ.

14. සභාපතිවරයා හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය පවරණු ලැබූ නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ ඉල්ලා සිටි ඕනෑම විටක වලංගු බලපත්‍රයේ මුල්පිටපත ත්‍රී රෝද රථයේ රියැදුරු හෝ අයිතිකරු විසින් ඉදිරිපත් කළ යුතුය.

15. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධි විධානයන් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එකී වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු රුපියල් හත්සිය පණහක් නොඉක්මවන දඩයකට යටත් කළ හැකිය. එකී උල්ලංඝණය කිරීමේ වරද දිගින් දිගටම කරගෙන යන අවස්ථාවක, නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු හෝ එකී උල්ලංඝණය කිරීමේ වරද කෙරෙහි, අවධානය යොමු කරන ලිඛිත දැන්වීමක් සභාපති විසින් හෝ තත් කාර්යය සඳහා ඔහුගෙන් බලයලත් නිලධාරියෙකු හෝ භාර කරනු ලැබීමෙන් පසු හෝ එකී වරද තවදුරටත් කරගෙන යනු ලබන, සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

16. මෙම ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් වුවද, සභාවේ යෝජනා සම්මුතියක් මගින් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හෝ පරිච්ජින්න කොට අලුත් ව්‍යවස්ථාවක් සැකසීම හෝ අමතර අතුරු ව්‍යවස්ථාවක් සෑදීම කළ හැකි වන්නේය.

17. අර්ථ නිරූපණය.

"සභාව" යන්නෙන් අගලවත්ත ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් අගලවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද,

"සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ බලයලත් නිලධාරියෙකු" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලබන ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකුද,

"සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ බලයලත් නිලධාරියෙකු" යන්නෙන් සභාපතිවරයා ලිඛිතව බලය පවරනු ලැබූ ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකුද,

"බල ප්‍රදේශය" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කර ඇති අගලවත්ත ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයද,

"ත්‍රී රෝද රථය" යන්නෙන් කුලී ගමන් අපේක්ෂාවෙන් නවතා තබා ගන්නා වූ ත්‍රී රෝද රථයක්ද,

"කුලී රියැදුරෙකු" යන්නෙන් ත්‍රී රෝද රථය පදවන අයිතිකරු හෝ එම රථය පැදවීම සඳහා අයිතිකරු විසින් යොදවා ඇති අයද,

"නැවතුම්පළ" යන්නෙන් අගලවත්ත ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කරනු ලැබූ ත්‍රී රෝද රථ නැවතුම්පලද,

"මාසිකව" යන්නෙන් එක් එක් මාසය ආරම්භයේ පළමු වෙනිදා සිට ඒ ඒ මාසයට අදාළ දින 28 හෝ දින 29 හෝ දින 30 හෝ දින 31කින් සමන්විත වූ මාසයකින්ද,

"ත්‍රෛමාසිකව" යන්නෙන් මාසිකව යන අර්ථකථනය මගින් දී ඇති දින ගණන ජනවාරි 01 වනදායින් ආරම්භව අනුයාත මාස 03 බැගින් දෙසැම්බර් 31 වනදා දක්වාද,

"වාර්ෂිකව" යන්නෙන් වර්ෂයක ජනවාරි 01 වැනිදායින් ආරම්භව දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන ලිත් වර්ෂයක්ද,

"පොලිස් නිලධාරියෙකු" යන්නෙන් 53 වැනි අධිකාරිය වන 1865 අංක 16 දරන පොලිස් ආඥාපනතේ 104 වන වගන්ති මගින් දී ඇති අර්ථකථනයමද,

"වෙනත් වාහන" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයද,

"ලියාපදිංචි හිමිකරු" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයද,

"පීඩාකාරී ක්‍රියාව" යන්නෙන් පීඩා ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයද අදහස් වේ.

18. මේ අතුරු ව්‍යවස්ථා දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ සම්බන්ධව යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**පළමුවන උපලේඛනය**

3(3) අතුරු ව්‍යවස්ථාව

පත් කරනු ලබන මාර්ග කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

1. කමිටුවේ සභාපතිවරයා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විය යුතු අතර, ලේකම් සභාවේ ආදායම් පරිපාලක විය යුතුය ;
2. ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ කාර්මික නිලධාරී ;
3. මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු ;
4. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු ;
5. කළුතර මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු ;
6. ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු ;
7. සභා බල ප්‍රදේශයට අයත් පොලිස් ස්ථානයන්හි රථ වාහන පොලිසියේ ස්ථානාධිපතිවරුන් හෝ ඔවුන් විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු බැගින් ;
8. සභා බල ප්‍රදේශය තුළ ඇති ත්‍රී රෝද රථ සංගම්වල නියෝජිතයෙකු බැගින්.

දෙවන උප ලේඛනය

4 වන අතුරු ව්‍යවස්ථාව




සෙන්ටිමීටර් 13කින් යුත් විෂ්කම්භයක් සහිත වෘත්තයකි.
පසුබිම දුඹුරු පැහැති වර්ණයෙන් යුත් ප්‍රාදේශීය සභා ලාංඡනයෙන් යුක්ත ආකෘතියේ පරිදි කරුනු අඩංගු ස්ටිකරයකි.

තුන්වන උපලේඛනය

6(2) අතුරු ව්‍යවස්ථාව

ත්‍රී රෝද රථ නැවතුම්පල බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය

1. (i) අයදුම්කරුගේ නම : ————.

(ii) ස්ථිර පදිංචි ලිපිනය : ————.

(iii) වරිපනම් අංකය : ————.

(iv) ස්ථිර පදිංචියට අදාල පළාත් පාලන ආයතනය : ————.

(v) ජාතික හැඳුනුම්පත් අංකය : ————.

2. (i) ත්‍රී රෝද රථ ලියාපදිංචි අංකය : ————.

(ii) පදවන්නා අයිතිකරුද, නැත්නම් කුලී රියැදුරකුද යන වග : ————.

(1) අයිතිකරු නම් වලංගු රියැදුරු බලපත්‍ර අංකය : ————.

(2) කුලී රියැදුරකු නම් :

(අ) රියැදුරුගේ නම : ————.

(ආ) ස්ථිර පදිංචි ලිපිනය : ————.

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය : ————.

(ඈ) වලංගු රියැදුරු බලපත්‍ර අංකය : ————.

3. බලපත්‍රය ඉල්ලුම් කරනු ලබන ත්‍රී රෝද රථ නැවතුම්පල : ————.

4. බලපත්‍රය ඉල්ලුම් කරන කාලය : ————. මසකට/මාස 03කට/වසරකට

මවිසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, යම් හෙයකින් එම තොරතුරු සාවද්‍ය බව තහවුරු වුවහොත් මාගේ ත්‍රී රෝද රථ නැවතුම්පල බලපත්‍රය පූර්ව දැනුම් දීමකින් තොරව, අවලංගු කිරීමට යටත් බවත්, ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් පිළිපැදීමටත් එකඟ වෙමි.

දිනය : ........................................................ ...................................................................

අයදුම්කරුගේ අත්සන.

..................................................................... මහතා / මහත්මියට ............................................................ අංක දරන ත්‍රී රෝද රථය ............................................................... දරන නැවතුම්පළෙහි නැවැත්වීම සඳහා බලපත්‍රය ................................................කාලයකට ලබාදීම අනුමත කරමි.

.............................................................

සභාපති,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

04 - 02

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.